රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 01/92

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 ජනවාරි මස 09 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානියන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් සහ
පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් හා
ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත.

**<u>රජයේ සේවකයින් හා විශ්‍රාමිකයන් වෙත රු.100/=ක</u>**
**<u>අතිරේක දීමනාවක් ගෙවීම.</u>**

රු.3000/= ට අඩු ඒකාබද්ධ මාසික ආරම්භක වැටුපකින් යුත් වැටුප් පරිමාණයක සිටින සියළුම රාජ්‍ය සේවකයින්ට දැනට ගෙවනු ලබන දීමනාවන්ට අමතරව රු.100/=ක අමතර මාසික දීමනාවක් 1992.01.01 දින සිට බල පවත්වන සේ ගෙවිය යුතුය.

02. විශ්‍රාමිකයන්ට ද මෙම මාසික දීමනාව එම පදනම මතම ගෙවිය යුතුය. මෙම කරුණ සම්බන්ධයෙන් වැටුප ලෙස සැළකිය යුත්තේ ඔවුන් හිමිකම් ලබන අඩු නොකළ විශ්‍රාම වැටුපය.

03. මෙම දීමනාව සියළුම අනියම්/ ආදේශක සහ දවස් පඩි ලබන සේවකයින්ට ද, ඔවුන් වැඩ කළ දින ගණන මත මසකට දින 21 ක අවමය පදනම් කරගෙන සමානුපාතිකව ගෙවිය යුතුය.

04. රජයේ සේවකයන්ට මෙම දීමනාව ගෙවන පදනම මතම පළාත් පාලන සේවකයන්ට ද මෙම දීමනාව ගෙවිය යුතුය.

05. මෙම දීමනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජීවන වියදම් දීමනාව ගෙවීමේ විෂයයෙන් ලබාගත නොහැකි විට වෙනත් පුනරාවර්තන වැය විෂයයන්ගේ ඉතිරිවීම්, වීරමොන් ක්‍රියා පරිපාටිය අනුගමනය කරමින් ලබාගත යුතුය. මේ ආකාරයෙන් මුදල් ලබාගත නොහැකි විට පමණක් අතිරේක මුදල් ගණනය කරන ආකාරය පෙන්නුම් කරමින් අතිරේක ප්‍රතිපාදන සඳහා ඉල්ලුම්පතක් භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

06. මෙම චක්‍රලේඛය භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලදී.

අ.කලේ/ (ආර්.අබේරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.